**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වූ දිවයින පුරා විහිදුණු ශාඛා ජාලයක් සහිත අපගේ සේවාදායක විශේෂිත බැංකුවක් සඳහා මූල්‍ය සහ ආයතනික සැලසුම්කරණය සඳහා උපායමාර්ගික නායකත්වය ලබා දෙමින් තිරසාර වර්ධනයක් සහ ආයතනික කාර්ය සාධනයක් කරා මෙහෙයවිය හැකි බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ පුළුල් අත්දැකීම් සහිත ක්‍රියාශීලී සහ ප්‍රතිඵල ඉලක්ක කරගත් වෘත්තිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
# මූල්‍ය සහ උපායමාර්ගික සැලසුම්කරණ

**රැකියා විස්තරය**

- මූල්‍ය අංශයේ සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ පසු කාර්යාල (Back Office) කටයුතුවල සමස්ත අධීක්ෂණය.
- බැංකුවේ සියලුම ගනුදෙනු නිසි පරිදි ගිණුම්ගත කර ඇති බව සහ CBSL, CSE, අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි වැනි අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අනෙකුත් නියාමන අවශ්‍යතාවලට අනුකූල වන බව සහතික කිරීම.
- තාක්ෂණික මූල්‍ය දැනුම සහ මගපෙන්වීම ලබා දීම, අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම සහ ඒවා වරින්වර සමාලෝචනය කිරීම.
- බදු ආශ්‍රිත කාර්යයන් අධීක්ෂණය කරන අතරතුර පාර්ශවකරුවන් සමග යහපත් සබඳතාවක් ගොඩනගා ගැනීම සහ පවත්වාගෙන යාම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය වෙමින් සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට සිදු කිරීම සහතික කිරීම.
- අයවැය, ක්‍රියාකාරී සැලැස්ම සහ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම සහ මෙහෙයවීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. බැංකුවේ ඉලක්ක, අරමුණු සහ මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම සඳහා මාසිකව පසු විපරම් කළ යුතුය.
- පිරිවැය කළමනාකරණය, ලාභදායීත්වය ඉහළ නැංවීම, අවදානම් කළමනාකරණය සහ ප්‍රාග්ධන සැලසුම්කරණය හරහා ශක්‍යතාව සහතික කිරීම සහ දිගුකාලීන මූල්‍ය සැලසුම්කණය සහ ESG ඒකාබද්ධ කිරීම හරහා තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීම.
- බාහිර පාර්ශ්වයට සහ කළමනාකාරිත්වයට අවශ්‍ය කරන සියලුම තොරතුරු නියමිත වේලාවට ලබා දීම.
- ව්‍යවස්ථාපිත අවශ්‍යතා අනුව වාර්ෂික වාර්තාව සකස් කිරීම සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම.
- බැංකුවේ අනාගත සංවර්ධන සහ සැලසුම් සකස් කිරීමට සහාය වීම.
- බැංකුවේ උපායමාර්ගික දිශානතියට සහාය වන කාර්යසාධන මිනුම් ක්‍රම සකස් කිරීම.
- සියලුම බදු ගෙවීමේ ක්‍රියාවලීන් කළමනාකරණය කිරීම සහ ව්‍යවස්ථාපිත ගෙවීම් අදාළ CBSL සහ CSE මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කිරීම.
- බාහිර හා අභ්‍යන්තර විගණකවරුන් සමග සාකච්ඡා කිරීම, විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ වාර්ෂික හෝ වෙනත් මූල්‍ය විගණන සඳහා පහසුකම් සැලසීම මෙන්ම කළමනාකාරිත්වය විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

**අපේක්ෂක සුදුසුකම් :**

- පිළිගත් වෘත්තීය ගිණුම්කරණ ආයතනයකින් ලබාගත් පූර්ණ වෘත්තීය සුදුසුකමක් (උදා: CA, ACCA සහ CIMA)

**අතිරේක සුදුසුකම් :**

- ගිණුම්කරණය, මූල්‍ය හෝ බැංකු ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රථම උපාධියක්
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් බැංකු, ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය හෝ වෙනත් ඕනෑම අදාළ විෂයයක් සම්බන්ධයෙන් ලබාගත් පශ්චාත් උපාධියක්.
- ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙකු (Key Management Person) ලෙස කටයුතු කර තිබිය යුතුය.
- වසර 5 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, එයින් වසර 3 ක් බැංකුවක හෝ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක ජ්‍යෙෂ්ඨ විධායක කළමනාකරණ මට්ටමේ තිබිය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 – 55 අතර විය යුතුය.

**ප්‍රතිලාභ**

- සුදුසුම අපේක්ෂකයා සඳහා ආකර්ෂණීය වේතන පැකේජයක් හිමිවේ.

සම්පූර්ණ විස්තර සහිත ජීව දත්ත පත්‍රිකාව සම්බන්ධ කර ගත හැකි තොරතුරු සහ ඥාතීන් නොවන දෙදෙනෙකු සමග මෙම දැන්වීම පළ කර දින 10 ක් ඇතුළත mslrjobs@sltnet.lk වෙත යොමු කරන්න. විෂය තීරයේ (Subject column) MSL Ref.8238 ලෙස සඳහන් කළ යුතුය.

MSL Management Systems (Pvt) Ltd.

**MSL management Systems (Pvt) Ltd.**
**නො. 10, ගෝතමී පාර, කොළඹ 08.**
**විද්‍යුත් තැපැල : mslrjobs@sltnet.lk,**
**දුරකථන : 0112015965**